www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගෝලීය ධනේශ්වර අර්බුදයේ දෙවන අදියර

**The second stage of the global capitalist crisis**

**නික් බීම්ස් විසිනි**
**2010 අප්‍රේල් 12**

*මෙහි පලවන්නේ 2010 අප්‍රේල් 03 දින පවත්වන ලද ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) රැස්වීමක දී එහි ජාතික ලේකම් නික් බීම්ස් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවයි.*

2008 සැප්තැම්බර් 15 දින ලේමන් බ්‍රදර්ස් ආයෝජන බැංකුව බිඳ වැටීමත් සමග හටගත් ආර්ථික හා මූල්‍ය අර්බුදය පිලිබඳව හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) විසින් කරන ලද තක්සේරුව කෙරෙහි පලමුව අවධානය යොමුකරමින් මෙම සාකච්ඡාව ඇරඹීමට මම අදහස් කරමි. එහිදී අප අවධාරනය කලේ ප්‍රථම කොටම, මෙය මුල් තත්වය කරා ආපසු පැමිනෙන්නාවූ වාරික අර්බුදයක් නොව, ධනේශ්වර සමුච්ඡයකරනයේ පූර්වයෙන් පැවති විධික්‍රමයෙහි බිඳවැටීමක් වූ බවයි.

මෙහි අර්ථය කුමක් වූයේ ද? එය, ධනේශ්වර ආර්ථිකය ක්ෂනිකව ඇනහිටීමක් හෝ අතොරක් නැතිව පහතට ඇදී යන සර්පිලයක් නොවේ නම් නිර්දය ලෙස අඛන්ඩව පහත වැටීමක් පවා නොවීය. මෙම බිඳවැටීමේ වැදගත්කම රැඳී පැවතුනේ, පන්ති සම්බන්ධතාවන්ගේ හා විවිධ ධනේශ්වර බලවේගයන් අතර සම්බන්ධතාවන්ගේ, ප්‍රතිව්‍යුහකරනය මගින් අංගලක්ෂිත නව අවධියක් ඇරඹී ඇතැයි යන කාරනය තුලය යන්න අපි අවබෝධ කරගත්තෙමු.

අපගේ විශ්ලේෂනයේ අත්‍යවශ්‍ය අන්තර්ගතය වටහා ගැනීම සඳහා අපට ධනේශ්වර පද්ධතියේ වර්ධනය පිලිබඳ ඓතිහාසික ප්‍රවිෂ්ටයක් අවශ්‍ය වනු ඇත. ධනේශ්වර ප්‍රගතියේ මහා අවධිය 1914 අගෝස්තු 04 දින සුනුවිසුනු වී ගිය අවසානයකට පැමිනියේය. ප්‍රථම ලෝක සංග්‍රාමයේ පුපුරා යාම, මහ බලවතුන් අතර අවාසනාවන්ත ගැටුමක් නොවීය. ට්‍රොට්ස්කි පැහැදිලි කල පරිදි එය, "ආර්ථික පද්ධතියක් එයට ම ආවේනිකවූ ප්‍රතිවිරෝධයන් කරනකොටගෙන විනාශයට පත්වීම පිලිබඳ ඉතිහාසයේ, දැවැන්තම බිඳවැටීමයි." එම විශ්ලේෂනය කරන ලද්දේ 1915 දීය. ඉන් පසුව එලඹි සිදුවීම් මගින් එය මුලුමනින්ම සනාථ කෙරුනි. යුද්ධයේ අවසානය, ප්‍රථම ලෝක සංග්‍රාමයටත් වඩා විනාශකාරී ගැටුමක් වූ දෙවන ලෝක යුද්ධයෙන් කුලුගැන්වුන සමාජ, ආර්ථික හා දේශපාලන කැලඹීම්වල දශක තුනක් වූවා මිස, මුලින් පැවති තත්වය කරා ආගමනයක් නොවීය. ට්‍රොට්ස්කි අනතුරු ඇඟවූ පරිදි, මිලියන ගනන් කම්කරුවන්ගේ ලේ හා ඇටකටු මතින් කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල පාවාදීමේ පසුබිම තුල පමනක්, 1940 ගනන්වල අග භාගයේ ආරම්භ වූ, ධනවාදයේ නව පිබිදීමක් ඇතිකල හැකිවිය. ආර්ථික වශයෙන් මෙය පිහිටුවනු ලැබුවේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආර්ථික ශක්තිය හා ඇමරිකානු ධනවාදයේ දියුනු නිෂ්පාදන විධික්‍රම අවශේෂ ලෝකයට ව්‍යාප්ත කිරීම මතය.

මෙම නව ධනේශ්වර ප්‍රසාරනයේ වඩා වැදගත් උපාංගයක් වූයේ, යුරෝපය ස්ථාවරත්වයකට ගෙන ඒමයි. "ජර්මානු ප්‍රශ්නය" විසඳීම, එනම්, යුද්ධයේ ප්‍රතිපලයක් ලෙස මිස ඇතිකල නොහැකි ජර්මානු ධනවාදයේ ගතිකය දරාගතහැකි දේශපාලන හා ආර්ථික ආකෘතියක් වර්ධනය කිරීම, හා "ජපන් ප්‍රශ්නය" ලෙස හැඳින්විය හැකි නැගෙනහිර ලෝකය පිලිබඳ විසඳුම යි. වර්තමාන තත්වයේ ආලෝකයෙන් මෙම විසඳුම් දෙකෙහි වැදගත්කම විශේෂයෙන් අවධාරනය කිරීමට මට අවශ්‍යය. එනම්, පශ්චාත් යුද්ධ සමථයේ උරුමයක් ලෙස, යුරෝපා සංගමය හා එහි ව්‍යවහාර මුදල මාධ්‍ය කරගෙන හටගෙන තිබෙන කැලඹීම් හා එක්සත් ජනපදයත් චීනයත් අතර වර්ධනය වන ගැටුම් ය.

ධනේශ්වර වර්ධනයේ වක්‍රය තුල පශ්චාත් යුද්ධ උත්පාතය, 1970 ගනන් මුල ලෝක ධනේශ්වර ආර්ථිකයේ ආවේනික ප්‍රතිවිරෝධයන් යලි හිස ඔසවන තෙක්ම ඇදී ගියේය. මෙය විප්ලවවාදී නැගීමක අවධියක් විය. එය අවසානයකට ගෙනඑනු ලැබුවේ, පැබ්ලෝවාදීන්ගේ ද ආධාරය ඇතිව ස්ටැලින්වාදය හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදය විසින් කරන ලද පාවාදීම්වලින් පසුව පමනි. කම්කරු පන්තිය තුල විප්ලවවාදී දිශානතියක් වර්ධනය කිරීම වැලැක්වූ පැබ්ලෝවාදීන්ගේ භූමිකාව තුලින් ඔවුන්, 1950 ගනන් මුල හතරවන ජාත්‍යන්තරයේ ක්‍රියාමාර්ගික පදනම්වලට එල්ල කල ප්‍රහාරයන්ගේ ඓතිහාසික වැදගත්කම

එලිමහනට ගෙන ආවේය. පැබ්ලෝවාදීන් විසින් ගෙනආ විවිධ න්‍යායික හා ක්‍රියාමාර්ගික සංශෝධන, ට්‍රොට්ස්කිවාදයට එරෙහි මධ්‍යම පන්තික කැරැල්ලක් සේ ප්‍රකාශිතවූ රූපාකාරයක් විය. ඔවුන් පදනම් වූයේ 1917 ඔක්තෝබර් විප්ලවයේ අත්දැකීම් යලි අනුගමනය කල නොහැකිය යන තර්කය මතය.

1968-75 අවධියේ විප්ලවවාදී අරගලයන් පාවාදීම මත රැඳී සිටිමින් ධනේශ්වරය, කම්කරු පන්තියට එරෙහිව සමාජ හා දේශපාලන ප්‍රහාරයකට මුල පිරීය. මෙය, 1950 හා 1960 ගනන්වල සමුච්ඡයකරනයේ පැරනි පිලිවෙල වියැකී යාම මගින් අවශ්‍යතාවක් බවට පත්කරන ලද ලෝක ධනේශ්වර ආර්ථික ප්‍රතිව්‍යුහකරනය සමග බැඳී තිබුනු අතරම, එහි අත්‍යවශ්‍ය උපාංගයක් ද විය. එහෙත්, කම්කරු පන්තියට එරෙහිව ගෙනගිය මෙම ප්‍රහාරය, එයින්ම හා ඒ තුලින්ම පමනක් සමුච්ඡයකරනයේ නව මාදිලීන් මත පදනම් වූ ධනේශ්වරයේ නව උත්පාතයක් සඳහා මග හෙලිකලේ නැත. බිඳවැටීම හෝ, වඩා නිවැරදිව කිවහොත් ස්ටැලින්වාදී නිලධරය විසින් සෝවියට් සංගමය බිඳ දැමීම ද ලාභ ශ්‍රම සම්පත් සහිත ලෝකයේ සුවිශාල ප්‍රදේශ ගෝලීය ප්‍රාග්ධනයේ පරිපථයන් තුලට ඒකාග්‍ර කිරීම ද සමඟ හූ දේශපාලනික වාතාවරනය තුල සිදුවූ ඉමහත් වෙනස්කම් නොවන්නට එය සිදු නොවනු ඇත.

එහි ප්‍රතිපල වශයෙන් ගෝලීය ශ්‍රම බලකාය තුල සිදුවූ ප්‍රමානාත්මක වර්ධනය පිලිබඳ විවිධ ගනන් බැලීම් සිදුකර තිබේ. සමහරකට අනුව එය දෙගුනවී තිබේ. සමහරක් එය දශලක්ෂ 300 සිට 500 ක් දක්වා වර්ධනයවී ඇති බව පෙන්වා දෙයි. නිවැරදි ප්‍රමානය කුමක් වුවත් මෙය, ලෝක ආර්ථික ඉතිහාසයේ අතිශයින්ම බලගතු පරිවර්තනයක්ය යන්න පැහැදිලිය. 1990 ගනන් මුල ආරම්භවූ ධනේශ්වර නැග්මේ පදනම් සම්පාදනය කරනු ලැබුවේ, මෙම මාරුව නැත්නම් ලෝක ධනවාදයේ ව්‍යුහය තුලම සිදුවූ මෙම වෙනසයි. සෝවියට් සංගමය පෙරලා දමනු ලැබුවොත් හා චීනය අධිරාජ්‍යවාදී බලයන්ගේ අනසක යටතට ගෙන ආවොත් නව ධනේශ්වර ඉල්පීමක් ශක්‍ය වනු ඇතැයි සඳහන් කරමින් 1920 ගනන් වලදී ට්‍රොට්ස්කි එවන් වර්ධනයක හැකියාව පරිකල්පනය කලේය. අප දන්නා පරිදි ඉතිහාසය ගත්තේ වෙනස් මගකි. එහෙත් ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනයෙහි සාරය නොමැකී පවතියි.

ගෝලීය ප්‍රාග්ධනයේ පරිපථය තුලට චීනය, ඉන්දියාව හා අනෙකුත් රටවල ශ්‍රම බලකායන් ඒකාග්‍ර කිරීම, පරිගනක මත පදනම්වූ නව තාක්ෂනයේ වර්ධනය, ප්‍රවාහන කාර්යක්ෂමතාවේ වර්ධනය, තොරතුරු හුවමාරුව ඇතුලු දේ ධනවාදයේ නව ඉල්පීමක් සඳහා කොන්දේසි නිර්මානය කලේය. මෙම පියවරයන්, එකලස්කිරීමේ පේලි ක්‍රමය මත පදනම්වූ සමුච්ඡයකරනයේ පූර්ව මාදිලීන්ගේ ඇදවැටීමට දායකවූ ලාභානුපාතිකයන්ගේ වැටීම ජයගැනීම සඳහා, ප්‍රාග්ධනය විසින් ගසන ලද කැරැල්ලේ නිමැවුමක් විය.

කෙසේ වුවත්, ධනේශ්වර වර්ධනයේ චක්‍රය තුල ඇතිවූ මෙම නව ඉල්පීම, බෙහෙවින්ම අස්ථාවර ස්වභාවයක් ගෙන තිබේ. එනම්, 1914 දී බිඳවැටීමට මගපාදමින් 1890 ගනන්වල මැද භාගයේ ආරම්භ වූයේ ද ඒ හා සමාන තත්වයකි. (මෑතක දී මා කියවූ ප්‍රකාශයක් තුල එම ලේඛකයා 2008 අර්බුදය 1907 ඇමරිකානු බැංකු අර්බුදයට සමාන කර දක්වයි. එහෙත් ඉන් යන්තම් සත් වසරකට පසුව සිදුවූයේ කුමක්දැයි පැහැදිලි කිරීම දක්වා ඔහු ගමන් කලේ නැත.)

පසුගිය දශක දෙක තුල සිදුවූ ඉහල නැගීම පදනම් වූයේ, එක් අතකින් ලාභ ශ්‍රමය සූරාකෑම හා අනෙක් අතින්, ප්‍රධාන ධනේශ්වර ආර්ථිකයන් විසින් මෙසේ වැඩී ගිය අතිරික්ත වටිනාකම් සමුදාය සූරාකෑම සඳහා වර්ධනය කරන ලද මූල්‍ය යාන්ත්‍රනයන් හා කටයුතු මතය. ප්‍රධාන ධනපති රටවල් සමහරක ආර්ථික ව්‍යුහය තුල සිදුව ඇති පරිවර්තනයේ තරම, බ්‍රිතාන්‍යයේ විවිධ දත්ත මගින් ඇඟවුම් කරයි. මාර්තු 25 දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයේ පලවූ තීරුවක් තුල එහි ආර්ථික ලියුම්කරු මාර්ටින් වුල්ෆ් මෙසේ සටහන් කරයි. "තැචර්වාදයේ ආර්ථික දායාදය කැපී පෙනෙයි. 1997 ත් 2006 ත් අතර කාලයේ ආර්ථික වර්ධනයෙන් සියයට 40 ක් ව්‍යාපාරික සේවා මගින් ද සියයට 13 පමන මූල්‍ය අතරමැදි කටයුතු වලින් ද ජනනය කලේය. නිෂ්පාදනයේ දායකත්වය ශුන්‍යයට ආසන්න විය. වෙලඳපොලේ ප්‍රතිපලය වූයේ එයයි. මහා බ්‍රිතාන්‍යයේ ආර්ථිකය අනෙකුත් විශාල යුරෝපීය රටවලට වඩා වේගයෙන් ප්‍රසාරනය විය. එබැවින් වර්ධනය තිරසාර හා සතුටුදායක බව පෙනී ගියේය." සමුච්ඡයකරනයේ නව මාදිලීන් නාගරික භූ දර්ශනයේ ඉමහත් වෙනස්කම් මතුවී ඒමට කොන්දේසි සැකසීය. කර්මාන්තශාලා පිහිටි නගරවල දැන් සාප්පු සංකීර්න හා මූල්‍ය මධ්‍යස්ථාන ගොඩනැගීමේ නව වර්ධනයක් සිදුව ඇත. එහෙත් මේ සියල්ල එක් අතකින් හෝ තවත් අතකින් වෙනත් තැනකදී උපුටාගන්නා අතිරික්ත වටිනාකම් සූරාකෑම සමඟ බැඳී පවතියි.

දියුනු ධනේශ්වර ආර්ථිකයන් තුල මූල්‍යකරනය වේගයෙන් වැඩී ගියේය. වෙනත් වචන වලින් කිවහොත් ලාභය, එන්ට එන්ටම වෙලඳම හා භාන්ඩ නිෂ්පාදනය තුලින් වෙනුවට, මූල්‍ය නාලිකාවන් ඔස්සේ උකහා ගැනෙයි. එක්සත් ජනපදය තුල 1980 දී සියයට 10 කටත් වඩා අඩුවෙන් පැවති ව්‍යාපාර ලාභ සමස්තයේ මූල්‍යමය දායකත්වය, 2007 වන විට සියයට 40 ක් දක්වා නැගුනි.

මැකින්ස්කි ග්ලෝබල් ආයතනය විසින් කරන ලද මෑත සමීක්ෂනයකට අනුව එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය ද ඇතුලු ප්‍රමුඛ ධනපති රටවල් 10 ක දල නය බර සියයට 60 න් නොහොත් ඩොලර් ට්‍රිලියන 40 න් ඉහල ගොස් තිබේ. පෞද්ගලික හා ආන්ඩු යන දෙඅංශයේම මුලු නය අනුපාත, 1990 දී දල දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සාමාන්‍යයෙන් සියයට 200 සිට 2008 වන විට සියයට 330 කටත් වඩා ඉහල නැඟී තිබේ. එම කාලය තුලම මහා බ්‍රිතාන්‍යයේ නය අනුපාතය සියයට 200 සිට 450 දක්වා වැඩිවිය. නයෙන් වැඩි පංගුවක් යොදවා ඇත්තේ කාර්මික නිෂ්පාදනය සඳහා නොව මූල්‍ය කටයුතු සඳහාය.

මූල්‍යකරනයේ වර්ධනය තුලින් දහනය කල නයෙහි නැඟීම, නව ස්වර්නමය යුගයක් යයි කියනු ලැබේ.

කෙසේ වෙතත්, මුදල් වලට හුදෙක් එහි ස්වභාවය නිසාම තව තවත් මුදල් ඉපයිය හැකිය යන ධනේශ්වරය හා එහි දෘෂ්ටිවාදීන් වෙලාගත් මිත්‍යාව තිබියදීම, මූල්‍ය ප්‍රාග්ධනය සඳහා උපුටාගනු ලබන ලාභය, අවසාන විග්‍රහයේදී කම්කරු පන්තිය වෙතින් සූරාකනු ලබන අතිරික්ත වටිනාකම සඳහා හිමිකම් පෑමකි. අවසානයේදී මූල්‍යමය ලාභය, අත්කරගත හැකි අතිරික්ත වටිනාකම මඟින් සීමා කෙරෙයි.

සෑම අදියරක දී ම මූල්‍ය ප්‍රාග්ධනයේ කටයුතු මෙම නියාමය මඟින් හසුරුවන බවක් මෙයින් අදහස් නොවේ. එයට පටහැනිව සිදුවන්නේ නීතිය උල්ලංඝනය කිරීමයි. එහෙත් එයට එම නියාමයෙන් ගැලවී යා නොහැකිය. ප්‍රාග්ධනයේ පලමු පරිච්ඡේදය තුලදී ම මාක්ස් සඳහන් කල පරිදි, "ස්වභාවධර්මයේ අතික්‍රමනකාරී නියාමයක් සේ" වටිනාකම පිලිබඳ නියාමය ද එහි බලය ක්‍රියාත්මක කරයි, කෙසේද යත් "අපගේ ඇස් පනාපිට නිවසක් කඩාවැටෙන විට ගුරුත්වාකර්ෂන නියාමය ක්‍රියාත්මක වන ආකාරයටම ය."

ව්‍යාජ ප්‍රාග්ධනය, එනම්, ඍජුව ම අතිරික්ත වටිනාකම උපුටා නොගන්නා ප්‍රාග්ධනය, වෙනත් තැනක දී නෙලාගන්නා අතිරික්ත වටිනාකමට හිමිකම නැත්නම් උරුමය කියාපායි. එයට, කම්කරු පන්තියෙන් උපුටාගනු ලබන අතිරික්ත වටිනාකමේ වැඩිවීම බෙහෙවින් ඉක්මවා යන අනුපාතයකින්, වඩ වඩාත් සැකයට තුඩුදෙන මූල්‍ය ගනුදෙනු හරහා, නිරතුරුව ම වැඩි වැඩියෙන් ලාභ සූරාගැනීමේ හකියාව ලැබේ. තව ද, අනතුරු හඳුනාගත් අවස්ථාවල පවා, වෙලඳපොලේම පීඩනය හමුවේ එයට එපරිද්දෙන් ක්‍රියා කිරීමට බලකෙරේ. සංගීතයේ හඬ තවමත් පැතිර යද්දී සෑම දෙනාටම නැඟී සිට නැටීමට සිදුවන්නේ යයි 2007 ජූලි මාසයේදී සිටි ගෘෘප් ප්‍රධානී චක් ප්‍රින්ස් කල ජනප්‍රිය ප්‍රකාශය පරිද්දෙනි. අවමුඛ උකස්කරයන්ගේ සුරැකුම් වැනි ලාභ සමුච්ඡයේ යාන්ත්‍රනයෙහි එක් අන්ඩක් කඩාවැටුනු විට, සමස්ත කඩදාසි ගෙයම ඇද වැටීමත් සමඟ, ධනේශ්වර පද්ධතියේ නියාමයන් අවසානයේදී තෙමේම ප්‍රකාශයට පත්කර ගත්තේය. නිවසේ එක් පර්ශවයක් බිඳවැටුනු විට සමස්ත ව්‍යුහයම ඇද වැටුනි.

එවිට, බැංකු හා මූල්‍යායතන ගලවා ගැනීම සඳහා ධනපති රාජ්‍ය මැදිහත් විය. එහිදී රාජ්‍යය, බැංකුවල නය කන්දරාව සිය ගිනුම් පොත් වලට ඇතුල්කර ගත්තේය. වෙනත් ලෙසකින් කිවහොත් එය, බැංකු හා මූල්‍යායතනවල ඉල්ලීම් වලට ගරු කලේය. කෙසේ වෙතත්, ගැටලුව ඉවත්ව ගොස් ඇති බවක් මින් අදහස් නොකෙරේ.

මූල්‍ය වෙලඳපොලවල ක්‍රියාකාරිත්වය තුලින්ම පැනනැංවූ මූල්‍ය ප්‍රාග්ධනයේ ඉල්ලීම් ඉටුකර ගැනීම සඳහා සැබවින්ම ලබාගත හැකිව තිබුනේ බෙහෙවින් අල්ප වූ අතිරික්ත වටිනාකමකි. ඊනියා "විෂ සහිත" හෝ නොවටිනා වත්කම්වල සමාජ අර්ථභාරය එයයි. කෙසේ වෙතත් රාජ්‍යය මැදිහත්වී මෙම ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීය. අතිරික්ත වටිනාකම බෙහෙවින් ඉක්මවා ගිය ව්‍යාජ ප්‍රාග්ධන සමුදාය, අතිරික්ත වටිනාකමට හිමිකම ඉදිරිපත් කිරීම පිලිබඳ ගැටලුව තවමත් ඉතිරිව තිබේ. ඉන්ද්‍රජාලයකින් මෙන් නව අතිරික්ත වටිනාකම් සමුදායක් නිර්මානය වී නොමැත. සිදුව ඇත්තේ, බැංකු හා මූල්‍යායතනවල ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් රාජ්‍යය තමන්ට හැකි පරිද්දෙන් ඒවා ගෙවා දැමීමත්, කම්කරු පන්තිය වෙතින් අත්‍යවශ්‍ය අමතර අතිරික්ත වටිනාකම් උපුටා ගැනීමේ කර්තව්‍යය තමන් වෙත පවරා ගැනීමත් ය.

සිදුව ඇති දෙයෙහි පරිමාව සැලකිල්ලට ගත යුතු ය. 2007 ජූලි හා 2009 මාර්තු අතර ගෝලීය බැංකුවල ව්‍යාපාර වස්තු මිල ගනන් සියයට 75 න් පහත වැටුනි. වෙලඳපොල ප්‍රාග්ධනකරනයේ අලාභය ඩොලර් ට්‍රිලියන 5 ක් විය. මහා බ්‍රිතාන්‍යයේ බැංකුවල ව්‍යාපාර වස්තු මිල ගනන් සියයට 80 න් කඩා වැටුනි. අනෙකුත් වත්කම් මිලෙහි වැටීමත් සමඟ එකට ගත් කල ගෝලීය ධන පරිහානිය ඩොලර් ට්‍රිලියන 25 ක් නැතහොත් ලෝක දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 45 ක ප්‍රමානයකි. එක්සත් ජනපදයේ හා මහා බ්‍රිතාන්‍යයේ වත්කම් මිලෙහි වැටීම මහා අවපාතය කාලයේ තරම්ම විශාලය. මූල්‍ය පද්ධතියට ධනේශ්වර රාජ්‍ය විසින් සපයා තිබෙන ඍජු ප්‍රධානයන්ගේ අගය ගෝලීය දළේනි යෙන් හතරෙන් එකකට සමානය. එක්සත් ජනපදයේ හා මහා බ්‍රිතාන්‍යයේදී එය එම රටවල දළේනි යෙන් තුනෙන් එකකට සමානය.

මෙම රාජ්‍ය මැදිහත්වීම, බැංකුවල තත්වය පිලිසකර කර තිබේ. එහෙත් එමගින් ආර්ථිකයට උත්තේජනයක් සපයා නැත. බැකුවලට සිය ලාභ වැඩිකර ගැනීමට හැකිවිය. මක්නිසා ද යත්, ඒවාට ලාභ ප්‍රාග්ධනයක් සපයාදුන් බැවින්ය. එහෙත් මෙය ආර්ථික වර්ධනය තුලට හැරී ගත්තේ නැත.

මෙම ගලවාගැනීමේ ක්‍රියාවලිය සඳහා ගෙවීමට ලෝක කම්කරු පන්තිය වෙතින් කෙතරම් ප්‍රමානයක් උපුටාගත යුතු ද යන්න පිලිබඳ ඇඟවීමක්, ආන්ඩුවල නයගැති භාවයේ නැඟීම පිලිබඳ සංඛ්‍යාලේඛන තුලින් ලබාගත හැකිය. රටවල් 67 ක රාජ්‍ය නය දදේනිට සාපේක්ෂව 2007 වසරේ තිබූ සියයට 80 සිට 2014 වන විට සියයට 125 දක්වා වැඩිවනු ඇතැයි ජාමූඅ අනාවැකි පලකොට තිබේ. එක්සත් රාජධානියේ හා එක්සත් ජනපදයේ එම සංඛ්‍යා දෙගුන වේ යයි සැලකේ. පසුගිය තෙවසර තුල, දදේනි සියයට 20-30 අතර ප්‍රමානයකින් සංවර්ධිත ඕඊසීඩී රටවල මූල්‍ය සමතුලිතතාව වෙනස්වී ඇතැයි ගනන් බලා තිබේ. ජාත්‍යන්තර සමථ බැංකුව විසින් මෑතකදී කල සමීක්ෂනයකට අනුව, වත්මන් ප්‍රවනතා දිගටම පැවතුනහොත්, එලඹෙන දශකය තුල දදේනි සමානුපාතිකව නය ප්‍රමානය පහත සඳහන් පරිදි වැඩිවනු ඇත. ජපානයේ සියයට 300 ද එක්සත් රාජධානියේ සියයට 200 ද ප්‍රන්සය, අයර්ලන්තය, ඉතාලිය හා එක්සත් ජනපදයේ සියයට 150 දක්වා ද වැඩිවනු ඇත. නය සඳහා පොලිය වර්තමානයේ ආන්ඩුවල වියදමෙන් සියයට 5 සිට සෑම තැනක දී ම සියයට 10 කටත් වඩා, එක්සත් රාජධානියේදී එය සියයට 27 තරම් ප්‍රමානයකින්, ඉහල නගිනු ඇත.

මීලඟ අවධියේ දේශපාලන ආර්ථිකය සම්බන්ධයෙන් මෙම සංඛ්‍යාවන්හි වැදගත්කම කරා දැන් අපි එලඹ සිටිමු. රාජ්‍යයේ මූල්‍ය අර්බුදයෙහි අර්ථය අපට පැහැදිලිව දැකගත හැකිය. සමාජ ශුභසාධන, සෞඛ්‍ය, අධ්‍යාපනය හා තවත් දේ සඳහා ආන්ඩුවල සියලු වියදම් කැපීම යනු අවසාන විග්‍රහයේදී ප්‍රාග්ධනයට අත පෙවිය හැකි අතිරික්ත වටිනාකමෙන් මූල්‍ය අර්බුදය පියවා ගැනීමකි. ලෝකය පුරාම ධනපති ආන්ඩු දැන් ක්‍රියාවට නගා ඇති සමාජ වියදම් කැපීම හා කම්කරු පන්තියේ සමාජ තත්වයට පහර ගැසීමෙහි අර්ථය වන්නේ, බැංකු හා මූල්‍යායතන වලට ඇපදීමේ අරමුදල් සඳහා අවශ්‍ය අතිරික්ත වටිනාකම, රාජ්‍ය විසින් උපුටාගත යුතුය යන්නයි.

විප්ලවවාදී අරගලයේ නව කාලපරිච්ඡේදයක් සඳහා වෛෂයික පදනම් මෙම ක්‍රියාවලීන් මගින් නිර්මානය කෙරෙයි. ගැටුම නොවැලැක්විය හැකිය. දැනටමත් බැංකු වෙත ප්‍රදානය කර ඇති ධනය පියවා ගැනීමට අවශ්‍ය අතිරික්ත වටිනාකමේ විශාල පදාසයන් ධනපති ආර්ථිකය තුලට පොම්ප කල හැකි යම් නවීන තාක්ෂනයක් හෝ නැවුම් ලාභ ශ්‍රම මූලාශ්‍රයන් ඇත්තේ නැත. සමාජ පිරිවැය සඳහා පූර්වයෙන් උකහාගෙන වැය කල දැවැන්ත අතිරික්ත වටිනාකම් සමුදායක් ධනපති රාජ්‍ය විසින් යලි සූරාගත යුතුය. ඒ අතර වාරයේ සමාජ විප්ලවය සඳහා මතුවන වෛෂයික කොන්දේසි අපට මුනගැසේ. පැරනි ක්‍රමයට පාලනය ගෙනයාමට ධනපති රාජ්‍යයට නොහැකිවන අතර කම්කරු පන්තියට නව පාලන තන්ත්‍රයන් යටතේ තවදුරටත් පැවතිය නොහැකි වේ.

බිඳවැටීමේ ආර්ථික පදනම් පිලිබඳ අපගේ විශ්ලේෂනය ඉතා වැදගත් දේශපාලන ගම්‍යයන් ගැබ්කර ගනියි. ධනවාදය යටතේ පන්ති අරගලයේ වෛෂයික පදනම වන්නේ, ධනේශ්වර නිෂ්පාදන ක්‍රියාවලිය තුලදී කම්කරු පන්තිය වෙතින් අතිරික්ත වටිනාකම් උකහා ගැනීම මුල්කරගෙන ධනේශ්වරය හා කම්කරු පන්තිය අතර හටගන්නා ගැටුමයි. එක්තරා අවස්ථාවක දී ධනපති රාජ්‍යට අත පෙවීමට හැකිවන ආකාරයෙන්, කම්කරුවන්ගේ එකිනෙකට වෙනස් කන්ඩායම් හා ධනපති පන්තියේ විවිධ කොටස් අතර ඇතිවන ගැටුම් අද අපට මුන නොගැසෙයි. ධනේශ්වරයේ විධායක කමිටුව ලෙස, විශේෂයෙන්ම එහි අධිකාරවත් කොටස වන මූල්‍ය ප්‍රාග්ධනයේ, ධනේශ්වර රාජ්‍යය ම ඉදිරියට පැමින තිබේ. අතිරික්ත වටිනාකම් උපුටා ගන්නා ප්‍රධාන ඒජන්සිය බවට එය පත්ව තිබේ. වඩාත් නිවැරදිව කිවහොත්, සමාජ පිරිවැය සඳහා යොදවා තිබෙන අතිරික්ත වටිනාකම් යලි සූරාගැනීම සඳහා එය මූලිකත්වය ගෙන කටයුතු කරයි. මෙහි අර්ථය වන්නේ, දේශපාලන බලය පිලිබඳ ප්‍රශ්නය කෙලින්ම න්‍යාය පත්‍රය මත තබන දේශපාලන අරගල නොවරදවා ම පැන නගිනු ඇති බවයි. ඉතාමත්ම මූලික සමාජ තත්වයන් පවා රැකගැනීම පිනිස කම්කරුවන් නිරතවන අරගල ඒ මෙහොතේ පටන් ම, බැංකුවලට ඇපදීමේ සිය ව්‍යායාමය සඳහා එම සම්පත් යෙදිය යුතු බව කියා සිටින ධනපති රාජ්‍යයට එරෙහි අරගලයක් බවට පත්වෙයි.

අප ග්‍රීසියේ තත්වය පිහිටුවිය යුත්තේ මෙම සමස්ත රාමුව තුලය. මාර්තු 17 දින ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය පැහැදිලි කල පරිදි ග්‍රීක අර්බුදය, 2007-08 වසරවල ආරම්භවූ ජාත්‍යන්තර අර්බුදයේ නව අදියරක් සනිටුහන් කරයි. කම්කරු පන්තියේ සමාජ තත්වය රඳවා තැබීමට යොදවා තිබෙන අතිරික්ත වටිනාකම් යලි සූරාගැනීමේ පැපැන්ඩ්‍රියෝ ආන්ඩුවේ කප්පාදු පිලිවෙත්, ඔස්ට්‍රේලියාව ද ඇතුලු සියලු ප්‍රමුඛ ධනපති රටවල කම්කරු පන්තියට එරෙහිව දියත්වන අඛන්ඩ හා ගැඹුරුවන ප්‍රහාරයක පලමු වෙඩි මුරයයි.

පැපැන්ඩ්‍රියෝ ආන්ඩුව හා එය පෙනී සිටින මූල්‍ය උත්සුකයන්, විවිධ වෘත්තීය සමිති සංවිධාන විසින් එයට පිරිනමන ලද සහයෝගය නොතිබෙන්නට

බෙලහීන වනු ඇත. වඩාත් වැදගත් වන්නේ ග්‍රීසියේ සිදුවීම්, හිටපු රැඩිකල් හා ව්‍යාජ වාම සංවිධානවල භූමිකාව පිලිබඳව අප කල විශ්ලේෂනයේ වැදගත්කම ඉස්මතුකර තිබීමයි. ඔවුහු කප්පාදුවේ විරුද්ධවාදීන් ලෙස පෙනී සිටිති. ඒ සමගම ඔවුහු, "වමේ එකමුතුව" හා කම්කරු පන්ති එකමුතුව රැකගැනීමේ නාමයෙන් එම පියවරයන්ට එරෙහි අරගලය වෘත්තීය සමිති වෙත පැවරිය යුතු යයි එක හෙලා පවසති. අනෙක් අතට වෘත්තීය සමිති, කම්කරු පන්තිය ආන්ඩුවට යටත්කර තැබීමට කැපවී සිටිති.

කප්පාදුවට එරෙහි අරගලයට පෙරට යා හැක්කේ වෘත්තීය සමිති තන්ත්‍රයන්ට එරෙහි දේශපාලන කැරැල්ලක් මත එය පදනම් කරන තාක් දුරට පමනි. තව ද, මූල්‍ය ප්‍රාග්ධනයේ ඉල්ලීම් මත පැපැන්ඩ්‍රියෝ ආන්ඩුව ක්‍රියාවට නගන පියවරයන්ට විරෝධය පාමින් සටන් කල හැක්කේ, දේශපාලන බලය හා සමස්ත ආර්ථිකය ම සමාජවාදී පදනමක් මත ප්‍රතිසංවිධානය කිරීම පිලිබඳ ප්‍රශ්නය දැනුවත්ව හා ඍජු ලෙස මතුකරන්නාවූ ඉදිරිදර්ශනයක පදනම මත පමනි. මෙම ඉදිරිදර්ශනය මත ග්‍රීසියේ පමනක් නොව, යුරෝපයේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තිය බලමුලු ගැන්වීම සඳහා සටන් වදින ව්‍යාපාරයකට පමනි.

## යුරෝපීය සංගමයේ අර්බුදය

ග්‍රීක තත්වය පිලිබඳ තවත් ඉතා වැදගත් අංශයක් තිබේ. පූර්වයෙන් පැවති සමුච්ඡයකරන මාදිලියේ බිඳ වැටීම, ධනේශ්වර පද්ධතියේ සිරස් සම්බන්ධතා ලෙස හඳුන්වනු ලබන පන්ති සම්බන්ධතා, ප්‍රතිව්‍යුහගත කිරීම න්‍යාය පත්‍රය මත තබා ඇතුවා පමනක් නොව, තිරස් සම්බන්ධතා ලෙස සලකන ප්‍රමුඛ ධනේශ්වර බලවතුන් අතර සම්බන්ධතා, ප්‍රතිව්‍යුහකරනය ද ඉස්මතු කර තිබේ. ග්‍රීක ඇපදීම මත යුරෝපය තුල අර්බුදයක් හටගෙන තිබේ. වඩාත් නිවැරදිව කිවහොත්, නයෙන් දහනය කල ග්‍රීක ආර්ථික ප්‍රසාරනයෙන් ජර්මානු ධනවාදය සැලකිය යුතු වාසි ලබා ඇත යන කාරනය තිබියදී මෙන්ම අයර්ලන්තය, ස්පාඤ්ඤය, ඉතාලිය හා පෘතුගාලය තුල පවත්නා අර්බුදයෙන් ද වාසි සලසාගෙන තිබියදීත්, ජර්මන් ධනේශ්වරය ඇපදීමක් සංවිධානය කිරීමට දක්වන විරුද්ධත්වය, යුරෝපා සංගමයේ ඉතිහාසය තුල බරපතලම අර්බුදයක් හටගන්වා තිබේ.

මෙම අර්බුදය එහි ඓතිහාසික සන්දර්භයෙහි පිහිටුවිය යුතුය, ධනවාදය යටතේ සිදුවූ යුරෝපීය ඒකාබද්ධය එහි සීමාව කරා පැමින ඇත. එහෙත් එය ඉදිරියට යාමට අසමත් වුවහොත් එය හුදෙක් එක් ස්ථානයකට පමනක් සීමා නොවනු ඇත. විනාශකාරී ප්‍රතිවිපාකයන්ගේ සම්භාව්‍යතාවය ද සහිතව එය දිගහැරීමට පටන් ගනු ඇත.

යුරෝපා සංගමය නැඟී ආවේ, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ක්‍රියාවට නැගූ වැඩ සටහන් මාලාවක් ඇසුරෙන්ය. සමස්ත යුරෝපීය ආර්ථිකයේම ඇතිවූ පොදු වර්ධනයේ සන්දර්භය ඇතුලත සිදුවූ ජර්මානු ආර්ථික ප්‍රසාරනය හේතු කොට ගෙන, පූර්ව දශක හත ඇතුලත ප්‍රන්සය හා ජර්මනිය අතර තෙවතාවක් පුපුරාගිය ගැටුම් යලි මතු නොවීම සහතික කරනු වස්, එම පියවර ගනු ලැබින. ආර්ථික ඒකාග්‍රකරනයේ පදනම වූයේ, බටහිර ජර්මනිය, ප්‍රන්සය, ඉතාලිය හා (බෙල්ජියම නෙදර්ලන්තය හා ලක්සම්බර්ග් යන රටවල් තුනේ කන්ඩායම) බෙනිලක්ස් රටවල් අතර පිහිටුවාගන්නා ලද, 1951 පැරිස් සම්මුතිය ලෙස ප්‍රකට යුරෝපියානු ගල් අඟුරු හා වානේ සමාජයයි. මෙයින් පසුව 1957 වසරේදී රෝම සම්මුතිය යටතේ පොදු වෙලඳපොලක් ගොඩනගන ලදී.

1970 ගනන් මුල බ්‍රෙට්න්වුඩ්ස් සම්මුතිය බිඳ වැටීමට ප්‍රතිචාර වශයෙන් යුරෝපීය මූල්‍ය ගිවිසුමක් ඇතිකර ගැනීමට විවිධ ප්‍රයත්න දරන ලද නමුත් විශේෂ සාර්ථකත්වයක් ලත් කිසිවක් නොවීය.

සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් හා සීතල යුද්ධය අවසන්වීමෙන් පසුව තත්වය මුදුනටම පැමිනියේය. සීතල යුද්ධය හා එය උරුමකොටගත් යුරෝපයේ බෙදීම අවසානයකට පත්වීමෙන් යුරෝපීය ධනේශ්වරයට ඓතිහාසික අවස්ථාවක් නිර්මානය කලේය. මක්නිසා ද යත්, එය මතභේදාත්මක ජර්මානු ප්‍රශ්නයට විසඳුමක් සැපයීමට උදව්වක් වූ බැවිනි. ජර්මනිය බෙදා තිබීම නැගෙනහිරට ප්‍රසාරනය වීමට බාධාවක් විය. ජර්මන් තාප්පය බිඳවැටීමත් සමගම ජර්මනිය ඒකාබද්ධ කිරීම පිලිබඳ බලාපොරොත්තු වලින් යුරෝපය සලිත විය. එහි ආර්ථික හා දේශපාලන බලයේ ප්‍රතිවිපාක පිලිබඳව බියට පත් තැචර් හා මිතරෝන් ඒකාබද්ධ යුරෝපයකට විරුද්ධත්වය පල කලහ. තැචර් මෙසේ පැවසූ බව වාර්තා විය. "අපි ඔවුන් දෙවරක්ම යුද්ධයෙන් පරාජය කලෙමු. දැන් ඔවුන් යලි හිස ඔසවමින් සිටියි" ඇය මේ ප්‍රශ්නය පිලිබඳව තමන් කල ප්‍රසිද්ධ ප්‍රකාශ ගැන සැලකිල්ක් නොදක්වා ජර්මනිය දිගටම බෙදා තැබීම ගැන සහතික වන ලෙස ගොර්බචොව්ට උපදෙස් දුන් බවක් ද පෙනී යයි.

එක්සත් රාජධානිය හා ප්‍රන්සය ඒකාබද්ධවීම වැලැක්වීමට අසමත්වූ නමුත්, ජර්මනිය රඳවාගැනීමට නොහැකි නම් අවම වශයෙන් එය ප්‍රසාරනය වන යුරෝපයකට ගැටගසා තැබීම අරමුනුකොටගත් එකඟත්වයක් ඇතිකර ගැනීමට සමත් වූහ. මැස්ට්‍රිච් ගිවිසුමේ පදනම වූයේ මෙයයි. පසුව යුරෝව යුරෝපීය පොදු ව්‍යවහාර මුදල ලෙස පිහිටුවීමේ එකඟත්වයක් ඇතිකරගන්නා ලදී. එක්සත් ජනපද ඩොලරයට විකල්පයක් ලෙස යුරෝව නගාසිටුවීමේ අවශ්‍යතාව ද ඇතුලුව බොහෝ සාධක මෙයට බැඳී තිබුනි. ජර්මනිය

සිය ව්‍යවහාර මුදල අතහැරීමට එකඟවීම හා යුරෝපීය බලවතුන් සිය මූල්‍ය කටයුතු නිශ්චිත සීමාවක් තුල තබාගන්නේය යන කොන්දේසිය මත ජර්මනිය මෙම ව්‍යාපෘතියට මුක්කුව සැපයිය යුතුය යන්න යුරෝව සඳහා පදනම සම්පාදනය කලේය. යුරෝවේ ශක්තිමත් පැවැත්ම සහතික කලේ මෙය පමනි. එහෙත් මෙම ව්‍යාපෘතිය යාන්තමින් දශකයක් ඉක්ම යද්දී කැබලි වී යාමට පටන් ගෙන තිබේ. 2008 දී මූල්‍ය අර්බුදය පුපුරා යන විටත් බෙදීම් මතුවෙමින් තිබුනි. සෑම මිනිසෙකුම තමා වෙනුවෙන්ය, වඩාත් නිවැරදිව කිව හොත් සෑම ආන්ඩුවක්ම තමන්ගේම බැංකු පද්ධතිය වෙනුවෙන්ය.

බොහෝ විචාරකයින් කියන පරිදි, විශේෂයෙන්ම *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රය, යුරෝපීය සංගමයට ජර්මානු ආකෘතිය ශක්‍ය නොවන්නේය. නියමිතව ඇත්තේ, යුරෝ සංගමයේ සියලු රටවල් සිය හිඟයන් කපාහල යුතුය, සිය පලදායිතාවය නැංවිය යුතුය, සිය ජාත්‍යන්තර තරගකාරිත්වය වැඩිකල යුතුය යන්නයි. මාර්තු 10 දින සිය තීරුවෙහි මාටින් වුල්ෆ් මෙසේ සඳහන් කරයි.

"යුරෝපීය කවුන්සිලයේ සභාපති හර්මන් වැන් රොම්පුයි රැස්වීමෙන් පසුව සඳහන් කලේ, 'ග්‍රීක බැඳුම්කරයන් හිමිකරගෙන සිටින සියල්ලන් වෙත, යුරෝ කලාපය කිසි විටෙකත් ග්‍රීසිය වැටීමට ඉඩ නොදෙනු ඇති බවට සහතික වෙතැයි අපි බලාපොරොත්තු වන්නෙමු' මෙම ප්‍රතිඥාව සාක්ෂාත් කල හැකි ක්‍රම ඇත්තේ දෙකක් පමනි. එකිනෙකාගේ සුභ සෙත වෙනුවෙන් සාමාජිකයන් හිස් චෙක්පත් ලිවිය යුතුය, නැතහොත් ඔවුන් ප්‍රමාද වන සාමාජිකයන්ගේ රාජ්‍ය මූල්‍ය සියතට ගත යුතුය. එසේම ආන්ඩු ද සියතට ගත යුතුය. ජර්මනිය කිසි විටෙකත් මුලින් කී දෙයට එකඟ නොවනු ඇත. එහෙත් දේශපාලනය පසුව කී දෙයට ඉඩ නොදෙනු ඇත. විශේෂයෙන්ම ලොකු රටවල් සම්බන්ධයෙන් එසේ වනු ඇත. එබැවින් වැන් රොම්පුයිගේ ප්‍රකාශය අභූතයක් ලෙස පෙනී යයි.

"දැන් ලොකු ප්‍රශ්නය වෙත යොමුවෙමු, පසුගිය සතියේ ප්‍රකාශනය තුල මෙසේ ද තර්ක කරයි." යුරෝ කලාපය තුල මූල්‍ය තිරසාරභාවය සහතික කරන හා අර්බුද අවස්ථාවලදී ක්‍රියාත්මක වීමට එහි පරිමාව වැඩි දියුනු කිරීම සඳහා, පවත්නා රාමුව ශක්තිමත් කිරීම හා ඌනපූරනය කිරීමේ අවශ්‍යතාවය වර්තමාන තත්වය විසින් එලිදක්වා ඇත. වැඩිමනත් හිඟ ක්‍රියාපටිපාටි ඇතුලුව ආර්ථික හා අයවැය අවදානම ගැන සුපරික්ෂාවෙන් සිටීම හා ඒවා වැලැක්වීමට අවශ්‍ය මෙවලම් අනාගතය සඳහා, ශක්තිමත් කල යුතුය.

"මෙහි අධිකාරවත් අදහස, පරියන්තයේ රටවල මූල්‍ය තත්වයන්ගේ දුබලවීම පිලිබිඹු කරන්නේ මූල්‍ය විනයක් නොමැතිවීම බවය. මෙය ග්‍රීසිය හා ඊට අඩු මට්ටමකින් පෘතුගාලය සම්බන්ධයෙන් සත්‍යයකි. එහෙත් අයර්ලන්තයේ හා ස්පාඤ්ඤයේ ඉතා දැඩි මූල්‍ය පිලිවෙත් පැවති බව පෙනී ගොස් තිබුනි. ඒවායේ දුබලකම රැඳී තිබුනේ පෞද්ගලික අංශයේ මූල්‍ය හිඟයන් තුලය. මූල්‍ය හිඟය පුපුරා ගියේ, අර්බුදයෙන් පසුව පෞද්ගලික අංශය නිවැරදිකිරීම් වලට බැසගැනීමත් සමගය. ගැටලුව පැවතියේ පෞද්ගලික අංශයේ මිස රාජ්‍ය අංශයේ නොවූ තාක් දුරට නියාමනය ද පෞද්ගලික මිස රාජ්‍ය අංශය වෙත යොමු නොවීය.

"පරියන්තයේ රටවල පෞද්ගලික නයෙහි ප්‍රසාරනය හා වත්කම් බුබුලු හටගැනීම, ආර්ථිකයේ සැබෑ ඉල්ලුමේ වර්ධනයක් නොමැති කමේ කැඩපත් පිලිබිඹුවක් විය. ඊසීබී (යුරෝපීය මහ බැංකුව) යුරෝ කලාපයේ සමස්ත ඉල්ලුමේ සෑහෙන තරම් අඩු හෝ වැඩි ප්‍රසාරන අනුපාතයක් නිර්මානය කල මූල්‍ය ප්‍රතිපත්තියක් ඉදිරිපත් කලේ මෙසේය. මේ අනුව, අද දිනයේ මූල්‍ය ව්‍යසනයන්ට යටින් පවත්නා හේතු කවරේදැයි අප අසන විගසම, අපට සිහිපත් විය යුත්තේ එය, යුරෝ කලාපයේ හා සියල්ලටත් වඩා ජර්මනියේ ආර්ථිකය තුල ඉල්ලුමේ මන්දගාමී වර්ධනය හිලව් කරන, අනුගතවීමේ මූල්‍ය ප්‍රතිපත්තියක් මත අවසන් වශයෙන් රැඳී සිටීමේ ප්‍රතිපලය වූ බවය.

"යුරෝ කලාපයේ අභ්‍යන්තර ඉල්ලුම හා අසමතුලිතයන් පිලිබඳ එවන් සාකච්ඡාවක් ජර්මානු ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සතුටට හේතු නොවේ. ප්‍රශ්නය එය වනතාක් දුරට, කවුන්සිලයේ ප්‍රකාශනය තුල සඳහන් කෙරුනු "වැඩි වර්ධනය කල ආර්ථික සම්බන්ධීකරනය" ගැන තිබෙන බලාපොරොත්තු ශූන්‍ය වේ. ඊටත් වඩා නරක දෙය වන්නේ, සිය හවුල්කරුවන් කුඩා මූල්‍ය හිඟයන් පවත්වා ගැනීම වෙත තියුනු ලෙස හැරෙනු දැකීමට ජර්මනිය දක්වන උනන්දුවයි. ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය වන යුරෝ කලාපය, ඒ අනුව. වාර්තාගත පහත් අභ්‍යන්තර ඉල්ලුමක් සහිත මහා ජර්මනියක් වීමේ දිසාවට ගමන් කරනු ඇත. ජර්මනිය හා අනෙකුත් කුඩා ආර්ථිකයන් නැඟී එන රටවලට කරන අපනයන වැඩිකර ගැනීමෙන්, මෙයින් ඉවතට මාවතක් පාදාගන්නවා විය හැක. විශේෂයෙන්ම තරගකාරී නොවන වියදම් බරින් මැඩී සිටින ව්‍යුහාත්මකව දුබල එහි හවුල්කරුවන් සඳහා මෙහි ප්‍රතිපලය වනු ඇත්තේ, හොඳම තත්වයෙන් නම්, වසර ගනනාවක් එකතැන පල්වීම ය. පාරම්බාන "ස්ථාවරත්වය" මෙය විය යුතු ද?

"මූල්‍ය සංගමය පිලිබඳ ව්‍යාපෘතිය දැවැන්ත අභියෝගයකට මුහුනපා සිටියි. එයට ග්‍රීක අර්බුදය විසඳීමේ පහසු මගක් නැත. එහෙත් ලොකුම ප්‍රශ්නය නම් යුරෝ කලාපය ජර්මනිය කැමති පරිදි කටයුතු නොකිරීමේ හැකියාවයි. යුරෝ කලාපයට ජර්මානු බවට

පත්විය හැක්කේ, දැවැන්ත අතිරික්ත සැපයුම අපනයනය කිරීමෙන් හෝ යුරෝ කලාපීය ආර්ථිකයේ විශාල පදාස දිගට ඇදෙන ගිලාබැසීමක් තුලට ඇද දැමීමෙන් හෝ බෙහෝ විට ඒ දෙකෙන්ම ය. අනෙකුත් රටවල් එසේ නොවන නිසා ජර්මනියට විය හැක්කේ ජර්මනිය වීම පමනි. යුරෝ කලාපයම ජර්මනිය බවට පත්වුවහොත් එය ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි මට නම් නොපෙනේ. පැහැදිලිව ම ජර්මනියට කෙටි කාලයේදී සිය මාවත සකසා ගත හැකිය, එහෙත් තමන් කැමති මාවතේ යුරෝ කලාපය දැක්කීම සාර්ථක කර ගැනීමට එයට නොහැකිය. දැවැන්ත අයවැය හිඟයන් අර්බුදයේ රෝග ලක්ෂනය මිස හේතුව නොවේ. මෙම උභතෝකෝටිකයෙන් ගැලවීමේ සතුටුදායක මඟක් තිබේ ද? මට පෙනෙන ආකාරයට නම් තවමත් නැත. එය සැබවින්ම බියකරුය.”

ජර්මනිය ඉල්ලා සිටින්නේ කුමක් ද? ආර්ථික වශයෙන් ශක්තිමත් යුරෝපයකි. එහෙත් එය සමූහාන්ඩුවක පදනමේ සාක්ෂාත් නොකල හැකි බව සනාථ වී තිබේ. ප්‍රකාශයට පත් නොකල තමන්ගේ ඊනියා දෙවන පොත තුල හිට්ලර් විසින් ඉදිරිපත්කල ආස්ථානයන් යමෙකු සිහියට නගාගත යුතුය. එහිදී ඔහු අවධාරනය කලේ එක්සත් ජනපදයේ ආර්ථික අභියෝගයට මුහුනදීම සඳහා යුරෝපය එක්සත් විය යුතු බවයි. එහෙත් එය යම් වර්ගයක සමූහාන්ඩුවක් ලෙස එක්සත් කල නොහැකි විය. එය එක්සත් කල යුතු වූයේ රෝමය සිය අධිරාජ්‍ය ගොඩනැගූ ආකාරයට හෝ අධිරාජ්‍ය ව්‍යාප්‍යතියක් ලෙස ප්‍රසියාව එක්සත් ජර්මනියක් ගොඩනැගූ ආකාරයට ය.

ග්‍රීක හා යුරෝපීය අර්බුදයෙන් ඔබ්බට හැරී බලන විට කෙනෙකුට පහත සඳහන් ප්‍රශ්නය නැගිය හැක. අර්බුදය පැන නැගී තැන් පටන් ප්‍රමුඛ ධනපති බලවතුන් අතර සම්බන්ධතා වැඩීගොස් ඇත්තේ කෙසේ ද? පොදු ගැටලු විසඳීම පිනිස එක්සත් වීමක් සිදුව තිබේ ද නැතහොත් අපට දැකගත හැක්කේ ගැඹුරුවන ගැටුම් හා ප්‍රතිවිරෝධතාවන් ද? යුරෝපය තුල පිලිතුර පැහැදිලිය.

පසු කාලයේදී වැඩි යමක් අසන්නට ලැබී නැති ජී 20 ස්ථාපනය කිරීම තිබියදී ම, ජාත්‍යන්තරව පවත්නේ වැඩෙන කුලල් කා ගැනීමකි. එය පසුගිය වසර අවසානයේ කෝපන්හේගන් නගරයේදීත් වර්තමානයේ එක්සත් ජනපදය හා චීනය අතර ගැඹුරුවන ගැටුම් තුලත් පැහැදිලිව දැකගත හැකිය. චීනය, සිය මුදල අවභාවිතා කරන්නෙක්ය යන්න මත ඇතිවන අවසන් තීරනය කුමක් වුවත් බෙදීම් ගැඹුරු වනු ඇත. චීනය සමඟ ගැටුමේදී ඔබාමා පාලනාධිකාරය තමන් සමග එක්වන ලෙස සිය සගයන්ගෙන් ඉල්ලා සිටිනු ඇත. මෙය ඕස්ට්‍රේලියාව පිලිබඳව ප්‍රධාන ඇඟවුම් ගැබ්කර ගනියි. ධනේශ්වරය චීනයට පක්ෂ හා විපක්ෂ කන්ඩායම් අතර බෙදී තිබෙන, කලාපයේ අනෙකුත් රටවල සිදුවී තිබෙන දේ මෙහිදී ද අපට හොඳින් දැකගත හැකිය.

ඕස්ට්‍රේලියාවේ වාතාවරනය දෙස බලන විට පසුගිය මාස අංග ලක්ෂිතව ඇත්තේ, දේශපාලන නැමීම් හා හැරීම් මාලාවක් මඟින්ය. එහි උත්තේජන වැඩසටහන් වලින් පසුව 2009 වසරේ රඩ්ගේ ලේබර් ආන්ඩුවේ මධ්‍යම ප්‍රතිපත්තිය වූයේ කාබන් විමෝචන අලෙවි ක්‍රමයක් (ඊටීඑස්) පිහිටුවීමය. මූල්‍ය ප්‍රාග්ධනයේ විවිධ කොටස් මෙය දැකගත්තේ ආසියානු කලාපය තුල ලාභදායී කාබන් වෙලඳම සඳහා සැපයුනු අනගි අවස්ථාවක් ලෙසය. එම පදනම මත ලිබරල් පක්ෂ නායක මැල්කම් ටර්න්බුල් එයට සහාය දැක්වීය. එම පනතට විරෝධය පලකල විවිධ ව්‍යාපාරික කොටස් බිලිබා ගැනීම හා කිසිදු මහජන විමර්ෂනයකින් තොරව ම එය අනුමත කර ගැනීම ඊටීඑස් සාකච්ඡාවන්හි සාරය විය. මේ තත්වය තුල ලිබරල් පක්ෂය දෙදරා ගිය අතර ටර්න්බුල් නෙරපන ලදී. ඉන් පසුව කෝපන්හේගන් සමුලුව බිඳ වැටුනු අතර ජාත්‍යන්තර වාතාවරනය බෙහෙවින් වෙනස් විය. ටර්න්බුල්ගේ අවසානයත්, ටෝනි ඇබට් ලිබරල් පක්ෂ නායකත්වයට ගෙන ඒමත් රඩ් ආන්ඩුවේ මාරුවක් ඇතිකිරීම සඳහා යොදාගනු ලැබින. එය, වියදම් කැපීමේ පියවර හා පලදායීතාවය මෙන්ම ජාත්‍යන්තර තරගකාරිත්වය ඉහල නැංවීමට කැපවීම සම්බන්ධයෙන් නම් වැඩි වෙනසක් සිදු නොකලේය.

විශේෂයෙන්ම මර්ඩොක්ගේ මාධ්‍ය ජාලය ද ඇතුලු ව්‍යාපාරික මාධ්‍ය හරහා ආන්ඩුවට දුන් පනිවිඩය ලබාගෙන වටහාගන්නා ලදී. “අපගේ කාලයේ මහාම සදාචාරාත්මක ප්‍රශ්නය” ඊටීඑස් මඟින් නියෝජනය කරන්නේ යයි රඩ් අපට පුන පුනා කියා සිටි ආන්ඩුවේ ක්‍රියාමාර්ගයෙහි ප්‍රමුඛත්වයට පත්ව තිබුනු දෙය හෙමින් සීරුවේම නොපෙනී ගියේය. මධ්‍යම ආන්ඩුවට පවරා ගැනීමේ රූපයෙන් සෞඛ්‍ය පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් එය විස්ථාපනය කෙරුනි. ව්‍යාප්‍යතියේ හරය වියදම් කැපීමයි. ආන්ඩුවේ දිශානතිය ගෙනහැර දක්වමින් මාර්තු 29 දින රඩ් විසින් කල ප්‍රධාන කථාවකදී මෙය එලිමහනට පැමිනියේය. 2008 සැප්තැම්බරයේදී ලේමන් බ්‍රදර්ස් ආයෝජන බැංකු බිඳ වැටීමෙන් පසුව ආන්ඩුවේ කටයුතු යුක්තිසහගත කරමින් කථාව පටන්ගත් ඔහු, ඉන් පසුව තම න්‍යාය පත්‍රය වෙත හැරුනි.

“2007 දී මා විරුද්ධ පක්ෂයේ නායකත්වයට පත්වීමෙන් පසුව, ඔස්ට්‍රේලියාවේ ව්‍යාපාරික කවුන්සිලය ඇමතූ ප්‍රථම අවස්ථාවේදීම මා සඳහන්කල පරිදි ගතික තරගකාරිත්වයකින් යුත් ලෝකය හමුවේ නිශ්චලව සිටීම යනු ආපස්සට යාමයි. ප්‍රතිසංස්කරන ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම සඳහා මා කැපවී සිටින්නේ එබැවින්ය.

"ප්‍රතිසංස්කරන ක්‍රියාවලිය ස්ථානගත කල යුත්තේ පලදායිත්වයේ වර්ධනය, ශ්‍රම බලකායේ සහභාගිත්වය හා මූට්ටු නැති ජාතික ආර්ථිකයක් තුලය."

පලදායිතාවය පිලිබඳ ප්‍රශ්නය ගැන සඳහන් කරමින් ඔහු මෙසේ පැවසීය. "1990 ගනන් අගභාගයේ පටන් පලදායිත්වය දිග කලක් පහත වැටෙමින් තිබීම ඔස්ට්‍රේලියාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වඩාත් කනස්සල්ල දනවන ප්‍රවනතාවකි. 1994-1999 අතර කාලයේ ඕස්ට්‍රේලියාවේ පලදායිතා වර්ධනය, ඕඊසීඩී (ආර්ථික සහයෝගීතාවය හා සංවර්ධනය පිලිබඳ) රටවලින් දෙවන තැනට පැමින තිබුනි. කෙසේ වෙතත් මෙම නැඟීමෙන් පසුව රටේ පලදායිතා වර්ධනය මන්දගාමී විය. 1999 හා 2007 අතර ඕඊසීඩී රටවල් අතර අපට හිමිවූයේ 14 වන තැනයි."

අනාගත පලදායිතාවේ වර්ධනය සඳහා තීරනාත්මක ප්‍රතිකර්මයක් ලෙස රඩ් හඳුනාගෙන ඇත්තේ යටිතල ව්‍යුහයයි. ඊනියා සෞඛ්‍ය සේවා ප්‍රතිසංස්කරන ඔහු මේ සන්දර්භයෙහි තැබීය.

"ප්‍රාන්තවල යටිතල ව්‍යුහයේ අත්‍යවශ්‍ය ආයෝජන කෙරෙහි යලි අවධානය යොමු කිරීමට ඉඩ සැලසෙන පරිදි, ප්‍රාන්ත ආන්ඩුවල ශේෂ පත්‍රයන් මුදා හැරීමේ දිසාවට තැබූ වැදගත් පියවරක්, ඕස්ට්‍රේලියානු ආන්ඩුවේ සෞඛ්‍ය සේවා ප්‍රතිසංස්කරන වැඩ සටහනෙන් නියෝජනය වන බව කිව යුතුය. සෞඛ්‍ය සේවා ප්‍රතිසංස්කරන ක්‍රියාවට නැඟීමත් සමග ආන්ඩුවට සමූහාන්ඩුවේ මූල්‍ය ප්‍රතිසංස්කරන ක්‍රියාත්මක කිරීමට ඉඩ සැලසේ.

"භාන්ඩාගාරයේ ගනන් බැලීම්වලට අනුව, පියවරක් නොගතහොත්, ඉදිරි වසර 20-30 කාලයේ ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්ත හා ප්‍රාදේශීය ආන්ඩු උපයා ගන්නා සමස්ත ආදායම ම සෞඛ්‍ය හා රෝහල්වල වියදම් සඳහා වැය කිරීමට සිදුවනු ඇත.

"ආන්ඩුවේ ප්‍රතිසංස්කරන මඟින් එලඹෙන දශකය තුල ප්‍රාන්ත ආන්ඩුවල සෞඛ්‍ය වියදම් වලින් බිලියන 15 ක් ඉතිරි වනු ඇතැයි ගනන් බලා තිබේ. මේ මඟින් ප්‍රාන්ත වලට මහාමාර්ග, පොදු ප්‍රවාහන හා අපගේ නගර හා කලාප වලට අනාගතයේදී අවශ්‍ය වන නාගරික යටිතල පහසුකම් වෙනුවෙන් ආයෝජනය කිරීමට අමතර හැකියාවක් ඇතිවේ."

ආන්ඩුවේ ඊනියා සෞඛ්‍ය සේවා ප්‍රතිසංස්කරනයේ සැබෑ අන්තර්ගතය මෙයින් හෙලිවී තිබේ. ප්‍රාන්ත මට්ටමේදී සෞඛ්‍ය වියදම් පහත හෙලීමෙන් පලදායිතාවය හා ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර තරගකාරිත්වය ඉහල නැංවීමේදී අත්‍යවශ්‍ය යටිතල ව්‍යුහයේ ගොඩනැඟීම් සඳහා මුදල් සම්පාදනය කරනු ඇති බවට රඩ් තර්ක කරයි.

එහෙත් ප්‍රාන්ත ආන්ඩු විසින් වැය කල යුතු මුදල් හුදෙක් මධ්‍යම ආන්ඩුවෙන් වැය කරන්නේ නම් මේ කිසිදු අරමුනක් ඉටු නොවනු ඇත. එහෙත් ෆෙඩරල් ආන්ඩුව මූල්‍ය වගකීම බාරගෙන වියදම් කැපීමට අත නොගැසුව හොත් එය, පෝල්ට ගෙවීම සඳහා පීටර්ගෙන් සොරකම් කිරීමක් වනු ඇත.

රඩ්ගේ සෞඛ්‍ය "ප්‍රතිසංස්කරනයේ" සබෑ අරමුන මෙයයි. එය ඉලක්ක කරන්නේ, වියදම් කැපීම සඳහා ඉහල සිට පහලට ක්‍රියාත්මක වන, ජාතිකව මග පෙන්වන යාන්ත්‍රනයක් ගොඩනැඟීමටයි. සැබවින්ම ඔහු එය වෙස් ගන්වන්නේ ප්‍රගතිශීලී ආරම්භකත්වයක් ලෙසටය. වියදම් කැපීමේ යාන්ත්‍රනයක් ඉදිරිපත් කිරීම ප්‍රගතියක් ලෙස හඳුන්වන වර්ගයේම ක්‍රමවේදයක් හඳුන්වා දීමත් සමග එලඹෙන කාලයේදී අපට තවත් විස්තර දැකගත හැකිවනු ඇත. මෙම සතිය මුල දියවැඩියා වැඩසටහන නිවේදනය කිරීමත් සමඟ එය දැනටම ආරම්භවී තිබේ. දියවැඩියාවට හා අනෙකුත් නිදන්ගත රෝග හා රෝගී තත්වයන්ට දැනට පවතිනවාට වඩා හොඳින් ප්‍රතිකාර කල හැකිය යන්න ගැන සැකයක් නැත. රෝහල්ගතවීම අවම කරන මධ්‍යගත ක්ෂනික ප්‍රතිකාර ක්‍රමයක් රෝගීන් වෙත ලැබෙන්නේ නම් දැන් පවතින තත්වයට වඩා එය සතුටුදායකය යන්න ගැන ද සැකයක් නැත. එහෙත් මේ කිසිවක් ඉහත සැලැස්මේ මෙන්ම වයස්ගතවූවන් රැකගැනීම ද ඇතුලු අනාගතයේ නිවේදනය කිරීමට නියමිත වැඩසටහන්වල ද අරමුන නොවන්නේය. මනා ප්‍රතිකාරවල අවශ්‍යතාවය හුවා දක්වන මේ පුරසාරම්වල අරමුන වනු ඇත්තේ ආන්ඩුවේ වියදම් කැපීමයි.

රඩ් ඔහුගේ ආන්ඩුවේ න්‍යාය පත්‍රය යලි තහවුරු කිරීමත් සමග මාධ්‍ය ඔහු පිටුපස පෙලගැසී ගත්හ. නිදසුනක් ලෙස සිඩ්නි මෝනිං හෙරල්ඩ් පත්‍රයේ අප්‍රේල් 2 දින "ඇබට්ගේ බොරුව පිලිබඳ තුනී කඩදාසිය" නමැති ශීර්ෂයෙන් ජෙසිකා අර්වින් විසින් පලකරන ලද වාර්තාව දැක්විය හැකිය. කුවීන්ස්ලන්ඩ්හි ජාතික පක්ෂයේ සෙනේට් සභික බානබි ජොයිස් ඒ ගැන සඳහන් කලේ පලදායිතා කොමිසමේ වාර්තාවෙන් ඉරාගත් පිටු පාවිච්චි කල හැක්කේ වැසිකිලි කඩදාසි ලෙස පමනක් බවය. විරුද්ධ පක්ෂ නායකයාගේ කතාවේ මුද්‍රිත පිටපත ද එම අරමුනටම සේවය කරන්නේ යයි ඇය පැවසුවාය.

ජාතික මට්ටමේ දේශපාලඥයෙකුට එරෙහිව ජන මාධයයෙන් "බොරුවක්" යන චෝදනාව එල්ල කරන අවස්ථා විරලය. ලිබරල් පක්ෂ නායකයා විසින් ආර්ථිකය පිලිබඳව කරන ලද ප්‍රධාන කථාවකට ප්‍රතිචාර වශයෙන් එසේ සිදුවීම ඊටත් වඩා විරලය. ඇයගේ

ප්‍රහාරයෙහි සැඩ පරුෂ භාවය පෙන්වන්නේ එය පැහැදිලිව ම අර්වින් මහත්මියගේ අදහසක් අනුව තීරනය වූවක් නොවන බවය. එය වනාහි, සෞඛ්‍ය සේවය වැනි විශාල වියදම් ශීර්ෂ මුල්කරගත් වියදම් කැපීම මගින් ආන්ඩුවේ නයගැතිකම අඩුකර ගැනීමේ සිය න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට මෙම අදියරේදී ලේබර් ආන්ඩුව හොඳම මෙවලම වශයෙන් යොදාගත යුතුය යන පාලක ප්‍රභූවේ බලගතු කොටසකගේ අදහස පිලිබිඹු කරන කර්තෘ මන්ඩල ප්‍රතිපත්තියකි.

ඕස්ට්‍රේලියාවේ පවතින්නේ හරියටම වෙනත් සමහර රටවල පවත්නා තත්වයම නොවේ. කෙසේ වෙතත් එය, සමස්ත ලෝකයම අලලාගෙන වර්ධනය වන මූලික ක්‍රියාවලියක ආරම්භක සංකලනයකි. සෑම ප්‍රධාන ධනපති රටකම ආන්ඩු වැඩසටහන්වල හරිමැද පිහිටා ආත්තේ සමාජ පිරිවැය කැපීමයි. චීනයට කෙරෙන අපනයනයේ උත්පාතයක් පවතින තත්වය හමුවේ ඔස්ට්‍රේලියානු ධනේශ්වරයට එක්තරා ප්‍රමානයක "උපාමාරු දැමීමේ" ඉඩක් විවෘතව තිබේ. නිෂ්පාදන කර්මාන්තය පුරා, වසා දැමීම් හා දොට්ට දැමීම් මාලාවක් සමඟ "මංතීරු දෙකේ" ආර්ථිකයක් මතුවී තිබෙන බවට පැහැදිලි ඇඟවුම් පවතියි. ශ්‍රම බලකායට සිදුවන හානිය දිගටම පවතිද්දී එම තත්වය තරුන ජනතාව කෙරෙහි ප්‍රමුඛ බලපෑමක් ඇතිකර තිබේ.

චීනය සමඟ ඇති ඔස්ට්‍රේලියානු ආර්ථිකයේ සම්බන්ධතා වේගයෙන් මාරුවිය හැකිය. එක්සත් ජනපදය ප්‍රතිප්‍රහාරයකට යාමට තීරනය කලහොත්, චීනය ඇමරිකානු වෙලඳපොලෙන් පිටතට ව්‍යාප්ත වීමට උත්සාහ දරනු ඇත. දැනටමත් එවැන්නක් ඇරඹී තිබෙන බවට පැහැදිලි ඇඟවුම් පවතියි. ඕස්ට්‍රේලියානු ධනේශ්වරය පෙලගැසෙන්නේ කුමන බලයක් සමඟ ද? අවසානයේදී සිදුවීමට හොඳටම ඉඩ ඇති, එක්සත් ජනපදය හා චීනය අතර තෝරාගැනීමකට එයට බල කෙරෙන "බිහිසුනු වාතාවරනයක්" ලෙස හඳුන්වා ඇති තත්වයක් හමුවේ කුමක් සිදුවේ ද? එවන් හැල හැප්පීම්වලට අමතරව, චීන ආර්ථික බුබුල පුපුරා යාම කෙසේ වෙතත්, චීනයේ ආයෝජන උත්පාතයේ කුමන හෝ තියුනු පහත වැටීමක් ඔස්ට්‍රේලියානු ධනවාදය කෙරෙහි තියුනු ප්‍රතිවිපාක ගැබ්කර ගනියි.

පවත්වන ලද ඔස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ආරම්භක සම්මේලනය තුලදී අප ලබාගත් කාර්ය සාධනය ඉදිරියට වර්ධනය කිරීමේදී අප ඉදිරියේ පවතිනු ඇත්තේ ඉතා තියුනු නැමීම් හා හැරීම් සහිත අවධියකි. එම කාර්ය සාධනයන් රැඳී පැවතුනේ, ඕස්ට්‍රේලියානු කම්කරු පන්තිය තුල මාක්ස්වාදී නායකත්වයක් ගොඩනැගීමේ අරගලය තුල විප්ලවවාදී ව්‍යාපාරය මුහුන දුන් මූලික දේශපාලන ප්‍රශ්න හා ගැටලු පැහැදිලි කිරීම මතය.

එලඹෙන අවධියේ මූලික දේශපාලන කර්තව්‍යය මාධ්‍යගතවනු ඇත්තේ, වසර අවසානයේ එලඹෙන මහ මැතිවරන ව්‍යාපාරය තුල පක්ෂයේ මැදිහත්වීම මතය. ගෝලීය ධනවාදයේ බිඳවැටීමෙන් නිර්මානය කල නව කොන්දේසි තුල කම්කරු පන්තිය සඳහා සමාජවාදී මූලෝපායක් සසප ඉදිරිපත් කරනු ඇත. ගෝලීය ධනවාදය තුල මුල්බැසගත් වෛෂයික ප්‍රවනතාවන්ගේ ප්‍රතිපලයක් ලෙස කම්කරු පන්තියේ මහජන අරගලවල මතුවීමක් අපි පූර්වාපේක්ෂා කරන අතර, අප පදනම් වන්නේ එවන් ලෝක ඓතිහාසික ඉදිරිදර්ශනයක් මතය. අවශ්‍ය විප්ලවවාදී ඉදිරිදර්ශනයක් හා නායකත්වයක් සම්පාදනය කිරීම සඳහා මෙම අරගල තුල කෙරෙන අපගේ මැදිහත්වීම, වර්තමාන ආර්ථික හා සමාජ පර්යායට අව්‍යාජ විකල්පයක් සොයන කම්කරුවන් හා තරුනයන්ගේ අලුත් ස්ථරයන් දේශපාලනිකව අධ්‍යාපන ගතකර වර්ධනය කිරීම මත පදනම් වනු ඇත.

© www.wsws.org